**වවුනියා මහානගර සභාව - 2023**

**-----------------------------------**

වවුනියා මහානගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 සිට 220 දක්වා වගන්ති සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මෙහෙයුම් පමණක් මෙම වාර්තාවේ දක්වන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සෑම විගණනය කරනු ලබන අස්ථිතයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම අස්ථිත්‍යයන්වල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 1.3 වවුනියා මහානගර සභාව සංස්ථාපනය කිරීම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

2022 සැප්තැම්බර් 06 දිනැති අංක 2296/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළාත් පාලන හා පළාත් සභා විෂයභාර අමාත්‍යවරයා විසින් 2023 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි වවුනියා නගර සභාව විසුරුවා හැර 2023 මාර්තු 20 දින සිට වවුනියා මහා නගර සභාව සංස්ථාපනය කර එම දිනය සභිකයින්ගේ ධූර කාලය ක්‍රියාත්මක වන දිනය ලෙස දක්වා තිබුණි. එහෙත් මහා නගර සභා ආඥා පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව නියමිත සභික සංඛ්‍යාව තෝරා පත් කරගෙන නොමැති අතර සභාව එම දිනයේදීම සංස්ථාපනය කරනු ලැබූ සේ සැලකිය යුතුය. එසේ වුවද, මහානගර සභා ආඥා පනතේ 170(1) වගන්තිය පරිදි නාගරික කොමසාරිස්වරයෙකු පත් කිරීමද සිදු නොකර තවදුරටත් වවුනියා නගර සභාව නමින්ම පරිපාලන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. තවද මහා නගර සභාව විසින් 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 1.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ඉඩම් හෙක්ටයාර 26.93කට අදාල ඉඩම් හිමිකම් ඔප්පු සහ පත්ඉරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වර්තමානයේ හිමිකම් රහිත ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | ඉඩම් හිමිකම් තහවුරු කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 02කට අධික කාලයක සිට පදිංචිකරුවන් 13,484 කගෙන් හිඟහිටි දේපළ බදු ශේෂය රු.23,162,586ක් පැවැති අතර වර්ෂ 01 සිට 10ක් දක්වා කාල පරිච්ඡේදයක සිට හිඟහිටි බදු කුලි රු.1,312,094ක් පැවැතුණි. | ආදායම් රැස්කිරීමේ නිලධාරීන් මාර්ගයෙන් දේපළ බදු අයකර ගැනීමටත් හිඟ බදුකුලී වාරික පදනමින් අයකර ගැනීමටත් පියවර ගෙන ඇති බව. | හිඟහිටි දේපළ බදු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 මාර්තු 20 දින සිට වවුනියාව මහා නගර සභාව නෛතිකව සංස්ථාපනය වී තිබුණත් ඒ සඳහා නාගරික කොමසාරිස්වරයකු පත් කර නොතිබුණි. | වියදම් ඇස්තමේන්තු සඳහා අනුමැතිය නොලැබීම මත නාගරික කොමසාරිස්වරයෙකු පත්කර නොහැකිව පවතී. | අවශ්‍ය අනුමැතිය ලබාගෙන නාගරික කොමසාරිස්වරයෙකු පත්කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් ගලි බවුසරය (Gully Bowser) අනතුරට ලක්වීමෙන් රු.204,500ක් පාඩුවක් සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 101 සිට 110ක් දක්වා විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග නොගෙන සභාවේ වාහන නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වාහන නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එය පාඩුවක් ලෙස නොසලකන ලද බව | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | වර්ෂ 05කට වරක් ප්‍රත්‍යාගණනය කළයුතු කඩකාමර 397ක දීර්ඝ කාලීන කුලී ගිවිසුම් අළුත් නොකර අඛණ්ඩව පසුගිය වර්ෂ 06 සිට 43ක් දක්වා කාලයක් ක්‍රියාත්මක කර තිබුණි. | කුලී ගිවිසුම් අළුත් කිරීමට පියවර ගනු ලබන බව. | ගිවිසුම් අළුත් කිරීමට පියවර ගතයුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/20 දරන 2009 පෙබරවාරි 19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව තානායම්වල පරිපාලනය පළාත් පාලන ආයතන වෙතම පැවරිය යුතු බව සඳහන් වුවත්, වවුනියා තානායම මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් සභාවට පැවරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම, 2019 අගෝස්තු මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා හිඟ තානායම් කුලී රු.2,229,222ක්ද අයකර නොතිබුණි. | අදාල කරුණ සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතින බැවින් මෙම නඩුවේ තීන්දුවෙන් පසුව ඉදිරි කටයුතු සිදුකරන බව. | සභාවේ පරිපාලනයට සතු කර ගැනීමට සහ හිඟ ආදායම් අයකර ගැනීමටත් ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ රු. 7,230,939ක් වැයකර ඉදිකළ වවුනියා කුලම සංචාරක කේන්ද්‍රස්ථානය පුද්ගලයෙකුට බදුදී තිබූ නමුත් එය වර්ෂ 04කට අධික කාලයක සිට මහජන භාවිතය සඳහා විවෘත නොකර නිෂ්කාර්යව පැවතුණි. | නඩුවේ තීන්දුව ප්‍රකාරව අදාල සංචාරක කේන්ද්‍රස්ථානය භාවිතයට ඉඩහැරීම සම්බන්ධයෙන් තීරණය කරනු ලබන බව. | වත්කම් අභාවිතව නොතැබීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | තනි පුද්ගලයෙකු විසින් බලෙන් අත්පත් කර ගෙන කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන සභාවට අයත් වෛරව පුල්ලියම් කුලමෙහි පිහිටි පර්චස් 07ක වපසරියකින් යුතු ඉඩම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉඩමේ මායිම් ලකුණු කිරීමේ කාර්යයන් අවසන් වූ වහාම එම ඉඩම ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | ඉඩම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාදුන් සංවර්ධන බලපත්‍ර 27ක් සඳහා පදිංචි වීමේ සහතික සභාව විසින් ලබාදී නොතිබුණි. | පදිංචි වීමේ සහතික සඳහා වූ අයදුම්පත් ලැබී නොතිබුණු බව. | පදිංචි වීමේ සහතික ලබාදීමට පියවර ගතයුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 02 සිට 21ක් දක්වා කාලයක් අක්‍රියව පැවති ට්‍රැක්ටර් 09ක් අළුත්වැඩියා කර පරිහරණය කිරීමට හෝ අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | අළුත්වැඩියා කර පරිහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | වත්කම් අභාවිතව නොතැබීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් 24ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග සිදුකරමින් පවතින බව. | වත්කම්වල හිමිකාරිත්වය කඩිනමින් නිරවුල් කරගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 02කට අධික කාලයක සිට අය නොකර පවතින හිඟහිටි සේවක ණය රු. 112,228 ක් අයකර ගැනීමට ඵලදායි පියවර ගෙන නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට පියවර ගනිමින් ඇති බව. | අයකර ගතයුතු හිඟ සේවක ණය අයකර ගැනීමට පියවර ගතයුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තෙමේන්තු ගත ආදායම් සහ වියදම් , තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදී ආදායම් විෂයන් 06ක සියයට 07 සිට සියයට 50ක් දක්වාත්, වැය විෂයන් 07ක සියයට 10ක සිට සියයට 97ක් දක්වාත් එක් මූලධන වැය විෂයක සියයට 52ක විචලනයක්ද පැවැතීම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | පුරෝකථනය කළ නොහැකි අනපේක්ෂිත වියදම් හේතුවෙන් අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර විචලනයන් පැවැතුණු බව. | අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට පියවර ගතයුතුය. |

**4.2 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 දරන පනත, 2000 අංක 53 දරන පනත සහ 2008 අංක 01 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත හා 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ “ආ” වගන්තිය ප්‍රකාරව සත්ත්ව ඝාතකාගාර සහ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සඳහා පාරිසරික බලපත්‍ර සභාව විසින් ලබාගෙන නොතිබුණි. | පාරිසරික බලපත්‍ර ලබාගැනීමට පියවර ගනු ලබන බව. | පාරිසරික බලපත්‍ර ලබාගැනීමට පියවර ගතයුතුය. |